## රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2021 අප්‍රේල් මස 27 දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ**
**මුදල් අමාත්‍ය**

2021 අප්‍රේල් මස ...26... වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

# උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේගු සං. ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් සහ රේගු සංකේතාංක 0303.55 යටතට වැටෙන ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel -*Trachurus spp.*) මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2 | | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි. ග්‍රෑමයට රු. 302.00 |
| 3 | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි. ග්‍රෑමයට රු. 40.00 |
| 4 | 08.04 | 0804.50.50 | මැංගුස්ටීන් - අළුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| | | 0804.50.60 | මැංගුස්ටීන් - වියළි | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 5 | 08.10 | 0810.50 | කිවිප්‍රූට් | කි. ග්‍රෑමයට රු. 175.00 |
| 6 | | 0810.90.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |